# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1381/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி |
| දිනය<br>Date | 04/11/2023<br>පැය 1545 | | |

# මාධ්‍ය නිවේදනය

**01. මාරක රිය අනතුරක් - සමන්තුරය පොලිස් වසම.**

2023.11.03 වන දින දහවල් කාලයේ සමන්තුරය පොලිස් වසමේ බංගලාවාඩි ප්‍රදේශයේදී සමන්තුරය දෙස සිට අම්පාර දෙසට ධාවනය වූ යතුරු පැදියක් වේගය පාලනය කරගැනීමට නොහැකිව මාර්ගයේ පෙරළී ඇදී ගොස් අම්පාර දෙස සිට සමන්තුරය දෙසට ධාවනය වූ යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත.

අනතුරින් යතුරුපැදි දෙකෙහි පැදිකරුවන් දෙදෙනා හා සමන්තුරය දෙස සිට අම්පාර දෙසට ධාවනය වූ යතුරු පැදියේ පසු පැදිකාරිය බරපතල තුවාල ලබා සමන්තුරය රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව අම්පාර දෙස සිට සමන්තුරය දෙසට ධාවනය වූ යතුරු පැදියේ පැදිකරු මියගොස් ඇති අතර අනෙක් තුවාලකරුවන් සමන්තුරය රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබයි.

**මරණකරු වයස අවුරුදු 57 ක් වූ සමන්තුරය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කිරීමෙන් අනතුරුව මෘත ශරීරය ඥාතීන්ට භාර දී ඇත. සම්මන්තුරය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2023.11.03 වන දින උදෑසන කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ සිංහපුර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් ග්‍රෑම් 500** ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 48 ක් වන ඉදිගහවත්ත, තල්පේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**